(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(7).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 අගෝස්තු මස 22 වැනි බදාදා**

---

## 2012 සැප්තැම්බර් මස 18 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 මැයි 11 දිනැති අංක 1757/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 ජූනි 19 දිනැති අංක 1763/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 ජූලි 13 දිනැති අංක 1766/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 ජූලි 19 දිනැති අංක 1767/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2012.08.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය. (2012 ජුලි 19 දිනැති අංක 1767/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ජුනි 20 දිනැති අංක 1763/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත, 2012 අප්‍රේල් 27 දිනැති අංක 1755/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 මැයි 18 දිනැති අංක 1758/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

රණවිරු සේවා අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2012 සැප්තැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2217/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ, ජනසෙවන වැඩසටහන යටතේ කොළඹ නගරය තුළ පැල්පත් හා සෙසු අවිධිමත් නිවාසවල වෙසෙන ජනතාව සඳහා නව නිවාස 65,000ක් ඉදි කිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නේද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන කවරේද;

(iii) මේ වන විට එම නිවාසයන්හි පදිංචි කර ඇති මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2238/'12

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරුමැද පළාත් සභාව වකුගඩු රෝගීන්ට නොමිලයේ බෙදා හැරීම සඳහා ප්‍රමිතියෙන් තොර ජල පෙරණ අක්‍රමවත් ලෙස මිලදී ගෙන ඇති බව එතුමා දන්නේහිද?

(ආ) එම ජල පෙරණ මිලදී ගැනීමේදී,

(i) වැය කළ මුදල හා ලබා ගත් ජල පෙරණ සංඛ්‍යාව;

(ii) අනුගමනය කළ ටෙන්ඩර් පටිපාටිය;

(iii) ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතනවල නම්, ලිපිනයන් සහ ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන්;

(iv) ටෙන්ඩරය ලබාදුන් ආයතනයේ නම හා ලිපිනය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ජල පෙරණ,

(i) සම්බන්ධ ප්‍රමිති පරීක්ෂාව රජයේ ආයතනයකින් සිදු නොකර මිලදී ගත් ආයතනයෙන්ම සිදු කිරීමට අනුමතිය ලබා ගත් ක්‍රියා පටිපාටිය කවරේද;

(ii) බෙදාහැරීම නතර කරන ලෙස විගණකාධිපතිවරයා නියෝග කර තිබියදීත් තව දුරටත් ඒවා මිලදී ගන්නේද;

(iii) මිලදී ගැනීමට මුදල් අනුමත කළ නිලධාරියා කවුරුන්ද;

(iv) මිලදී ගැනීම රජයේ මුදල් රෙගුලාසිවලට පටහැනිව සිදුකර ඇති බව පිළිගන්නේද;

(v) මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2218/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ, ජනසෙවන වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම සඳහා බිම් කොටස් ලක්ෂයක් ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට බිම් කොටස් ලක්ෂයක් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම වැඩසටහන යටතේ මේ වන විට බෙදා දී ඇති බිම් කොටස් සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් මේ වන විට ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1911/'11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2001 මැයි මස කැබිනට් අනුමතිය ලැබුණු "ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තියේ" නියමයන්ට අනුකූලව;

(i) ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීම් සිදු කරන්නේ එය නොවැළැක්විය හැකි වුවහොත් පමණක් බවත්;

(ii) නැවත පිහිටුවීමේ ස්ථාන තෝරාගැනීම, ජීවන දීමනා සහ සංවර්ධන විකල්ප තීරණය කරනු ලබන්නේ බලපෑමට ලක්වූ පුද්ගලයින්ගෙන් සම්පූර්ණ තොරතුරු විමසීමකින් පසුව බවත්;

(iii) ආදේශක ඉඩම් සැපයීම හෝ වන්දි වශයෙන් මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ නැතිවූ ඉඩම්, ඉදිකිරීම් සහ ජීවිකා වෘත්තීන් සලකා බැලීමෙන් පසුව බවත්;

(iv) මුළු ඉඩම සඳහා කඩිනමින් ප්‍රතිසම්පාදන අගයන් වශයෙන් වන්දි පිරිනැමෙන බවත්;

(v) ඉඩම් සඳහා ලේඛනගත හිමිකමක් නැති පුද්ගලයින්ටද සාධාරණ සැලකිල්ලක් දැක්වෙන බවත්; සහ

(vi) බලපෑමට ලක්වූ පුද්ගලයින් ප්‍රතිස්ථාපනය කිරීමට උදව් දෙන බව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට පහසුකම් සැපයෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට කොළඹ නගර සභාව තුළ ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය පිළිපදින ලද අවස්ථා සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන කවරේද; සහ

(ii) සියලුම මහ නගර සභා, නාගරික මධ්‍යස්ථාන සහ අගනගරවල ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය තදින්ම ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2219/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද - චින්තන දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ, ජනසෙවන වැඩසටහන යටතේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල රජයේ සේවකයින් වෙනුවෙන් මහල් නිවාස යෝජනා ක්‍රම හතරක් ක්‍රියාත්මක කිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස යෝජනා ක්‍රම අතරින් මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස යෝජනා ක්‍රම පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට එම මහල් නිවාසවල පදිංචිකර ඇති රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් මහල් නිවාස යෝජනා ක්‍රමය සඳහා වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2248/'12

ගරු තිස්ස අත්තනායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 වර්ෂයේදී වාර්තා වූ රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාව, හදාරා ඇති උපාධි පාඨමාලාව අනුව හා එක් එක් පළාත අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා 2011 වර්ෂය තුළ රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉදිරියේදී ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2631/'12

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තවත් ශක්තිමත් කිරීමට හා එම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට ඇති බාධක ඉවත් කරන බවට රජය විසින් පොරොන්දුවක් ලබාදුන් බවත්;

(ii) නැවත 2007 විශ්ව වාරික විමසුම (UPR) රැස්වීම අවස්ථාවේදී ද දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට රජය පොරොන්දු වූ බවත්;

(iii) දහඅටවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමෙන් එම පොරොන්දු කඩකර ඇති බවත්;

(iv) මෙම පොරොන්දු කඩකිරීම නිසා රජයේ විශ්වාසනීයභාවය ජාත්‍යන්තර වශයෙන් බිඳවැටී ඇති බවත්;

(v) එමගින් අප රට අපකීර්තියට ලක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශයන් හා ශ්‍රී ලංකාව සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව තුළින් ස්වාධීන කොමිෂන්වල අවශ්‍යතාවය නිර්දේශකර ඇති හෙයින් දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කර ස්වාධීන කොමිෂන් ස්ථාපිත කිරීමට රජය වහාම පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2632/'12

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගෙන තිබේද;

(ii) එම වර්ෂය තුළ බඳවාගනු ලැබූ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 මැයි මාසය වන විට රට තුළ සේවයේ යෙදී සිටි පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා තවදුරටත් පුරප්පාඩු පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2220/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, ''සැමට නිවසක් - හිතට සෙවණක්'' වැඩපිළිවෙළ යටතේ, නාගරික මහල් නිවාස හා රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන් තම නිවසේ සින්නක්කර අයිතිකරුවන් බවට පත්කිරීමේ වැඩපිළිවෙළ මාස තුනක් ඇතුළත නිම කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැඩපිළිවෙළ ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ තම නිවසේ සින්නක්කර අයිතිය ලැබූ නාගරික මහල් නිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචි ඉහත පරිදි සින්නක්කර නිවාස අයිතිය ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 09 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0851/'10

ගරු රවී කරුණානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවල දේශීය සහල් පරිභෝජනය කොපමණද;

(ii) 2011 සහ 2012 වර්ෂවල පරිභෝජනය සඳහා අවශ්‍යවේ යැයි ගණන් බලා ඇති සහල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 පෙබරවාරි මස සහල් මෙට්‍රික් ටොන් 100,000 ආනයනය කළ රජයේ ආයතනයන්හි නම් කවරේද;

(ii) ඉහත ආනයනයන් සඳහා මුදල් ලැබුණු මූලාශ්‍ර කවරේද;

(iii) මෙසේ ආනයනය කරන ලද සහල්වල ආනයනික මිල, විකුණුම් මිල, අලෙවි කරන ලද ප්‍රමාණය සහ ගබඩා කර තිබෙන ප්‍රමාණයන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑමයක මිල රු. 65/= ට වඩා වැඩියෙන් තිබියදී, මෙසේ ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 30,000ක් පමණ එක් කිලෝග්‍රෑමයක් රු. 31/= බැගින් 2010 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික අංශයට අලෙවි කර ඇති බවත්,

(ii) මෙම සහල් දේශීය වෙළඳපලෙහි අලෙවි නොකරන ලෙසට රජය අවධාරණය කර තිබුණද, පෞද්ගලික වෙළෙඳුන් ඒවා දේශීය වෙළඳපලෙහි අලෙවි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) මෙසේ සහල් අලෙවි කළ පෞද්ගලික වෙළෙඳුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1567/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අම්පාර දිස්ත්‍රික්කයට අයත්, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහඔය සිට පොල්ලේබැද්ද දක්වා මාර්ගයේ සම්බන්ධ කරමින් ඉදිකර ඇති යකඩ පාලම දිරාපත්ව, අබලන් වී ඇති බැවින් ජන ජීවිත දැඩි අවදානමට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1869/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පාරිභෝගික දුරකථන සම්බන්ධතාවලින් ලැබූ ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් පාරිභෝගිකයින් වෙත රැහැන් රහිත ස්ථාවර දුරකථන (CDMA) ලබා දීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) අද වන විට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලබා දුන් CDMA දුරකථන භාවිතා කරන පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතනය CDMA දුරකථන ලබාදීම ආරම්භ කළ දින සිට මේ දක්වා එමගින් ලැබූ ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ටෙලිකොම් ආයතනය විසින් ආරම්භයේදී CDMA දුරකථන සම්බන්ධතාවයක් ලබා දුන් මිල සහ එම දුරකථන සම්බන්ධතාවයක් ලබා දෙන වත්මන් මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2221/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, වර්ෂ 2015 වනවිට සෑම වතු සේවක පවුලකටම මූලික පහසුකම් සහිත නව නිවසක් ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට නව නිවාස හිමි වූ වතු සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉදිවෙමින් පවතින වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2286/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (VIII) අනුව හා 2006 අයවැයේ යෝජිත පරිදි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ හිඟ වැටුප් ගෙවීම ප්‍රමාද වී තිබේද;

(ii) එසේ නම්, ප්‍රමාද වී ඇති කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 අයවැය මගින්ද 2005.12.31 දිනෙන් පසුව විශ්‍රාම ගිය විදුහල්පති හා ගුරු සේවාවල අය සඳහා ජීවන වියදම් දීමනාව වැඩිකර නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත සියලු ආකාරයන්ගෙන් අපහසුතාවට පත්ව ඇති විශ්‍රාම ගිය විදුහල්පති හා ගුරු සේවාවල නියුක්තවූවන්ට දෙන සහනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2304/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිවාඩු ලබාගෙන සහ ස්ථිර වශයෙන් වෘත්තියෙන් ඉවත් වී ගුරුවරුන් ලෙස සේවය කිරීම සඳහා විදේශගත වූ ගුරුවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වර්ෂ දහය තුළ මෙරට අධ්‍යාපන අමාත්‍යාංශයේ පත්වීම් ලබා ගුරු වෘත්තියේ යෙදී සිටින විදේශිකයන් සංඛ්‍යාව ඔවුන්ගේ රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1199/'11

ගරු රවී කරුණානායක මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත පොල් පරිභෝජනය සහ ඒක පුද්ගල පොල් පරිභෝජනය කොපමණද;

(ii) ආනයනය කරන ලද පොල් ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කරන ලද පොල්වල වටිනාකම කොපමණද;

(iv) පොල් ආනයනකරුවන්ට රජය විසින් සත්‍ය වශයෙන්ම ලබා දෙන සහනාධාරය, එය සනාථ කිරීමට අවශ්‍ය කරුණු ද සමග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දේශීයව නිෂ්පාදනය කරන සහ ආනයනය කරන ලද පොල් මත පනවා ඇති සෘජු සහ වක්‍ර බදු වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1571/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ඇත්කඳුර ගා/සීවලී මහා විද්‍යාලයේ පන්ති කාමර හතරක් සහිත ගොඩනැගිල්ලේ වහලය සහ බිත්ති දිරාපත්වී අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින් එම විදුහලේ සිසු දරුදැරියන්හට දැඩි අනාරක්ෂිත තත්ත්වයක් යටතේ අධ්‍යාපන කටයුතු කරගෙන යෑමට සිදුව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල කඩිනමින් අලුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල කොපමණද;

(iii) අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග නිර්මාණ සහ සංවර්ධන සමාගම සතුව තිබී සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමට ලබාදුන් උපකරණ, ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් සම්පත් කවරේද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) ලබා දී ඇති ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය කොපමණද;

(iv) උපකරණ සහ යන්ත්‍ර ලබාදීමේ දී එදිනට තක්සේරු කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මගනැගුම සමාගමට ලබාදුන් යන්ත්‍ර සහ උපකරණවල සමස්ත වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකම් සඳහා ගිවිසුමකට එළැඹී තිබේද;

(iii) එසේ නම්, එම ගිවිසුම සභාගත කරන්නේද;

(iv) එම ගිවිසුම අනුව ලබාගත් වටිනාකම් වෙනුවෙන් රජයට කළ යුතු ගෙවීම් අවසන් කිරීමට නියමිත කාල සීමාව කවරේද;

(v) එම ගෙවීම්වලින් දැනට ගෙවා ඇති මුදල සහ ගෙවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2222/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, ධීවර නගර හා ගම්මාන ඉලක්ක කර ගෙන නිවාස 30,000 ක් ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 150 ක් වෙන් කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි රුපියල් කෝටි 150 ක මුදලක් වෙන් කළේ කුමන වර්ෂයේ අයවැයෙන්ද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාසවල පදිංචිකර ඇති ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2310/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2000 සිට 2011 දක්වා එක් එක් වර්ෂය තුළ පස්වැනි ශ්‍රේණියේ දී සහ අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේදී පාසල් හැර ගිය සිසුන් සංඛ්‍යාව,

(i) ස්ත්‍රී පුරුෂභාවය අනුව;

(ii) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය අනුව;

(iii) ග්‍රාමීය, නාගරික සහ වතු අංශ අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 2000 සිට 2011 දක්වා එක් එක් වර්ෂය තුළදී පාසලකට ඇතුළත් නොකළ වයස අවුරුදු පහ සහ දහහතර අතර ළමුන්ගේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2000, 2005, 2010 යන වර්ෂයන්හිදී දරුවන්,

(i) ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත්වීමේ;

(ii) පස්වැනි ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ;

(iii) සාමාන්‍ය පෙළ දක්වා රැඳී සිටීමේ;

අනුපාතයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයේදී පාසල් සිසුන්ගේ පරිගණක සාක්ෂරතාව ග්‍රාමීය, නාගරික සහ වතු අංශයන් යටතේ වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1307/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබාගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළැඹි පුද්ගල සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

යන්නත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1576/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි, ඉහළ බෙලිගල්ල ග්‍රාමීය රෝහලේ බාහිර රෝගී අංශය පවත්වාගෙන යන ගොඩනැගිල්ල දැඩි සේ අබලන් වී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ජීවිතවලටද තර්ජනයක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පිරියත හා උපකරණ සඳහා ලැබිය යුතු කුලී ගාස්තු වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කුලී ගාස්තුවලින් එක් එක් වර්ෂයේදී අය කරගෙන ඇති ප්‍රමාණය සහ අයකර නොගත් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගාස්තු අය කර නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2311/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළවන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාග ප්‍රතිඵල ඇගයීම සඳහා ''ඉසෙඩ් අගය'' භාවිතා කිරීම ආරම්භ කළ වර්ෂය කුමක්ද;

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සැලකිල්ලට ගත් දිස්ත්‍රික් ලකුණු මට්ටම වෙනස් කොට ඉසෙඩ් අගය සැලකිල්ලට ගැනීමට තීරණය කිරීමට ප්‍රධාන හේතුව කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ භාවිතවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයන්හි ප්‍රතිඵල ඇගයීම සඳහා ඉසෙඩ් අගය ක්‍රමවේදය යොදාගත් ලෝකයේ අනෙකුත් රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අ.පො.ස. උසස් පෙළ විභාගයේදී එක් විෂයයකට හෝ පෙනී නොසිටි සිසුවෙක් සඳහා වුවද විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී සැලකිල්ලට ගන්නා අවසන් ඉසෙඩ් අගය ලබා දෙන්නේද;

(ii) ඉහත විභාගයේදී සියලු විෂයයන්ට පෙනී සිට, එක් විෂයයක් හෝ අසමත් සිසුවකු සඳහා ද විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී සැලකිල්ලට ගන්නා අවසන් ඉසෙඩ් අගය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 10 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1387/'11

ගරු රවී කරුණානායක මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල එක් වර්ග අඩියක් සඳහා වන මිල කොපමණද; සහ

(iii) එම ගොඩනැගිලි බද්දට ගත් කාල සීමාව කවරේද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයට අදාළ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යාංශයට අයත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) පිටතින් ලබා ගන්නා අනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් කරන ලද පිටතින් ලබා ගන්නා සේවා සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පිටතින් සේවය ලබා ගැනීමේ පදනම මත සේවය ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) කාර්ය මණ්ඩලයේ සිටින මුළු සාමාජිකයන් සංඛ්‍යාව කවරේද;

යන්නත් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අදාළව ඉහත සඳහන් වර්ෂ සඳහා, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1644/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ පිහිටි නාගොඩ ආනන්ද කණිෂ්ඨ විද්‍යාලය වැසී ගොස් වර්ෂ හයක් පමණ ගතවී ඇති බවත්;

(ii) මේ වන විට, පාසල සතු සියලු ගොඩනැගිලි වල් බිහි වී, දිරාපත් වෙමින් පවතින බවත්;

(iii) නගරයේ පවතින ජනප්‍රිය පාසල්වල තදබදය අඩු කිරීම සඳහා මෙම පාසල නැවත විවෘත කරන ලෙස ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කරන්නේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(ii) නොඑසේ නම්, පාසලේ සම්පත් වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iv) එම ආර්ථික කටයුත්ත ආරම්භ කිරීම සඳහා ගතවන කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2009/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, රන්මිහිතැන්න සිනමා ගම්මානය ඉදිකර ඇති භූමියේ අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එය විවෘත කරන ලද දිනය කවරේද;

(iii) විවෘත කළ දින සිට අද දක්වා එම සිනමා ගම්මානය සිනමාපට සහ ටෙලි නාට්‍ය රූපගත කිරීමට භාවිතා කරන ලද එක් එක් අවස්ථාවේදී එම ආයතනය වෙත ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රන්මිහිතැන්න සිනමා ගම්මානයේ රූ ගත කරන ලද ටෙලි නාට්‍ය හෝ සිනමාපට කවරේද;

(ii) එම එක් එක් නිර්මාණයේ අධ්‍යක්ෂ, නිෂ්පාදක හෝ නිෂ්පාදනයට සම්බන්ධවූ සමාගම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2351/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කිසිදු අධිකාරියක් යටතේ ලියාපදිංචියක් ලබා නොමැති පෙර පාසල් විශාල සංඛ්‍යාවක් පවතින බවත්;

(ii) අදාළ අවම සුදුසුකම්වත් නොමැතිව දීර්ඝ කාලයක සිට පෙර පාසල්වල සේවය කරන ගුරුවරුන් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ගුරුවරුන් හා පෙර පාසල් විධිමත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පෙර පාසල් ගුරුවරුන් සඳහා රජයෙන් කිසියම් ස්ථිර මාසික වැටුපක් ගෙවීම සඳහා කටයුතු කිරීමට කොතරම් කාලයක් ගතවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2721/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියා දිස්ත්‍රික්කයේ "නැදුන්කර්නි ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ජල සම්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2780/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අද වන විට ශ්‍රී ලංකාව තුළ රූපවාහිනී සේවාවන් පවත්වාගෙන යාම සඳහා,

(i) ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාදී ඇති තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ලබා දී ඇති එක් එක් බලපත්‍රය වෙනුවෙන් උක්ත නම් සඳහන් බලපත්‍රලාභීන්ගෙන් අය කරගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2143/'11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා මුදල් යෙදවීමට රජයට අරමුදල් ලබාදුන් පෞද්ගලික අංශයේ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඉහත කී ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට සහයෝගය ලබා ගැනීම සඳහා මෙරටට ගෙන්වා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට සහයෝගය ඉල්ලා සිටීම සඳහා විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2011 නොවැම්බර් මාසයේ සෙන්ට් කිට්ස් නගරයට ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) එහි යාමට සහ ආපසු ඒමට දැරූ මුළු වියදම කොපමණද;

(iv) එම කණ්ඩායම සඳහා ලබාගත් කුලී ගුවන් යානා සඳහා දැරූ වියදම කොපමණද;

(v) ජයග්‍රහණය පිළිබඳ එපමණ විශ්වාසය තබා තිබියදී ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා සත්කාරක රට ලෙස කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වූයේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1837/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, හොරගොඩ - නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි භාග්‍යාගම නම් වූ උදාගමේ පදිංචිකරුවන්ට එම ඉඩම් මැන, මායිම් ගල් යොදා, ඉඩම් බලපත්‍ර ද සමග ඉඩම් බෙදා දුන් බවත්;

(ii) පසුව එම ඉඩම්වල අයිතිය තමන් සතු බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සඳහන් කර ඇති බවත්;

(iii) ඒ අනුව, එම ඉඩම් නැවත මැන බලපත්‍ර ලබාදීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පදිංචිකරුවන්ගෙන් මුදල් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ඉඩම් නැවත මැන බලපත්‍ර ලබාදීම සඳහා මුදල් ඉල්ලා සිටීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ඉඩම් නැවත මනිනු ලබන්නේ නම්, එම දිනය කවරේද;

(ii) ඉදිරියේදී එම ඉඩම්වලට අදාළව සින්නක්කර ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එම ඉඩම් සඳහා පදිංචිකරුවන්ගෙන් මුදල් අයකිරීමේ සැලසුමක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2127/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය පුළුල් කළ දුර ප්‍රමාණය කොපමණද;

(ii) එම මාර්ග පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කළ වර්ෂය සහ නිම කළ වර්ෂය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) එම මාර්ගය ඉදිකිරීමේ ඇස්තමේන්තුව ඉක්මවා මුදල් වියදම් කර තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග පුළුල් කිරීමේ කටයුතු සඳහා උප කොන්ත්‍රාත් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම උප කොන්ත්‍රාත් ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් ක්‍රමය අනුගමනය කළේද;

(iii) ටෙන්ඩර් කැඳවූයේ නම්, ඒ සඳහා ඉල්ලුම් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ටෙන්ඩරය ලබාදුන් අයගේ හෝ ආයතනයේ නම, ලිපිනය සහ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2354/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පෙර පාසල් සම්බන්ධයෙන් නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) වර්ෂ 2005 සිට 2010 දක්වා, ළමුන්ගේ රැකවරණය හෝ සංවර්ධනය කඩවීම සම්බන්ධයෙන් පැමිණිලි හෝ චෝදනා ලබා ඇති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ පෙර පාසල් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව මේ වනවිට අවධානය යොමුකර තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2784/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා වෙත යවන ලද 2011.01.03 දිනැති අංක එම්පීඑ/ඒඩී9/පීපීසී/2007/25 දරන ලිපිය මගින් එස්. බී. විමලවීර සහ පතිරගේ නිහාල් පෙරේරා යන දෙදෙනාට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව අවධානය යොමුකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා විසින් ඉහත නම් සඳහන් සේවකයින්ට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශවලට ගරු නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2809/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මැදවච්චිය ප්‍රාදේශීය සභාවට අයත්, අංක 63 මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් උඩුඹුගල ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීමක් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට සහ කනදරා ඔය හරහා පාලමක්ද ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2144/'11

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැදිරිගිරිය ජාතික පාසලේ මහා පරිමාණ දූෂණ ක්‍රියා දිගින් දිගටම සිදුවෙමින් පවතින බවත්;

(ii) ඉහත කී පාසලේ සිදුවී ඇති අරමුදල් අයුතු ලෙස පරිහරණය කිරීම් සිද්ධි කිහිපයක් ජනාධිපති විමර්ශන ඒකකය විසින් හෙළි කරගෙන තිබෙන බවත්;

(iii) අදාළ ඇතැම් අයථා ක්‍රියා පිළිබඳව පුවත්පත්වල වාර්තාකර තිබූ බවත්;

(iv) මෙම පාසලේ විදුහල්පතිවරයා පාසල දියුණු කිරීම නොසලකා හැර, වංචා සහගත ලෙස මුදල් උපයා ගැනීමේ අරමුණින් පමණක් කටයුතු කරමින් සිටින බවත්;

(v) එම විදුහල්පතිවරයා, ඔහු විසින් සිදුකරනු ලබන අයථා ක්‍රියාවලට විරුද්ධවන අවංක ගුරුවරුන් පීඩාවට පත්කරන බවත්;

(vi) එවැනි විදුහල්පතිවරුන් මෙරටේ තරුණ පරපුර විනාශ කරන බැවින් ඔවුන් ශ්‍රී ලංකාවට උවදුරක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුකාරී තත්ත්වයන් නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1838/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වරකාපොල, අඹේපුස්ස, දේවාල පාර, අංක 11 හි පදිංචි ජොෂ්ඨ මාධ්‍යවේදී ඩී. බී. ඇල්කඩුව මහතාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ චෝදනා සම්බන්ධයෙන් 2009.10.09 වැනි දින හා 2011.02.08 වැනි දින කට උත්තර ලබාගෙන ඇති බවත්;

(ii) ඇල්කඩුව මහතාට දිගින් දිගටම හිරිහැර කිරීම නිසා ඔහු දැඩි ආර්ථික හා මානසික පීඩනයකට පත්ව සිටින බවත්;

(iii) නිදහස් මාධ්‍ය භාවිතයට ඉඩ ලබාදෙන ලෙස ඒ මහතා විසින් වගකිව යුතු නිලධාරීන්ගෙන් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇල්කඩුව මහතාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

(ii) ඒ මහතාට මුහුණදීමට සිදුවූ අපහසුතාවයන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2128/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා පඩුවස්නුවර මැතිවරණ කොට්ඨාසය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් සභාවට සහ ප්‍රාදේශීය සභාවට අයත් රජයේ ප්‍රතිපාදන යටතේ හෝ විදේශ ආධාර මත ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම එක් එක් මාර්ගයේ දුර ප්‍රමාණය, පළල සහ ප්‍රතිසංස්කරණය කළ තත්ත්වය (තාර, කොන්ක්‍රීට්, කොන්ක්‍රීට් කැට) කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග ප්‍රතිසංස්කරණයට අදාළව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ටෙන්ඩර් කැඳවූයේ නම්, එක් එක් මාර්ගය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ටෙන්ඩර් ලබාදුන් අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත එක් එක් මාර්ග ප්‍රතිසංස්කරණය අවසානයේ වැයවී ඇති මුදල කොපමණද;

(ii) එම මාර්ග ප්‍රතිසංස්කරණයන් නිම කිරීමෙන් පසු කොන්ත්‍රාත්තු ලබා දුන් ආයතන විසින් තාක්‍ෂණික වාර්තා ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම වාර්තා සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 ඔක්තෝබර් මස 10 වැනි බදාදා)

2722/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ "වෙඩිතලතිව් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2723/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ මාන්තායි ටෙරස් ප්‍රදේශයේ නව ජල සම්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2724/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ "අඩරිජන් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2725/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ "වැල්වැටිතුරේ ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2726/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, "මුරුක්කන්කර්නි ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2727/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, උතුරු මාන්තායි ප්‍රදේශයේ "පඩියන්කුලම් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2728/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ "ඔඩ්ඩුසුඩාන් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2729/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2730/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, "මල්ලවි ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 11 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1389/'11

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල එක් වර්ග අඩියක් සඳහා වන මිල කොපමණද;

(iii) එම ගොඩනැගිලි බද්දට ගත් කාල සීමාව කවරේද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයට අදාළ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යාංශයට අයත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) පිටතින් ලබා ගන්නා ඇනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් කරන ලද පිටතින් ලබා ගන්නා සේවා සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පිටතින් සේවය ලබා ගැනීමේ පදනම මත සේවය ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) කාර්ය මණ්ඩලයේ සිටින මුළු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළව ඉහත සඳහන් වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1645/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි බෙලිඅත්ත පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා වර්ෂ ගණනාවක් ගත වී ඇති බවත්;

(ii) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීමෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව තම ගොවි නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේදී පවත්වන ලද බන්ධනාගාර ජේලර් - දෙවැනි පංතිය සහ සුබසාධක නිලධාරී - දෙවැනි පංතිය තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරු සඳහා වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එකී පුරප්පාඩු සඳහා උක්ත තරග විභාගයේ ප්‍රතිඵල මත මේ වන විට බඳවා ගැනීම් සිදුකර තිබේද;

(iv) එසේ නම්, බඳවාගත් අවම ලකුණු සීමාව කවරේද;

(v) ඉහත පරිදි බඳවාගත් අයගේ නම්, ලිපිනයන් සහ ලබාගත් ලකුණු ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එකී තරග විභාගයේ ප්‍රතිඵල පදනමට අමතරව වෙනත් පිරිස් බඳවා ගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vii) එසේ බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2110/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වාණිජ බැංකුවල, සේවක අර්ථසාධක අරමුදල මගින් හිමිකාරිත්වය දරන කොටස් හිමිකමේ වටිනාකම, එම එක් එක් බැංකුව අනුව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් සමාගමේ කොටස් ප්‍රමාණයන් මිලදීගත් දිනයන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ කොටස් හිමිකම මිලදීගනු ලැබුවේ කවර පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගෙන්ද;

(iv) එම එක් එක් කොටස් ප්‍රමාණය මිලදීගනු ලැබූ වටිනාකම කවරේද;

(v) ඉහත සඳහන් අයුරින් මිලදීගත් කොටස් පසුව විකුණා ඇත්නම්, එම කොටස් විකුණූ මිල කවරේද සහ එම කොටස් විකුණනු ලැබුවේ කවර පුද්ගලයන්ටද;

(vi) එලෙස කොටස් හිමිකාරිත්වය දරන එක් එක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා රජය සහ/හෝ සේවක අර්ථසාධක අරමුදල හෝ විසින් නම් කළ අයගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2346/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය කළ යුතු ආයතනය කවරේද;

(ii) 2000, 2005 සහ 2010 වර්ෂවලදී එම ආයතනය යටතේ ලියාපදිංචි වී ඇති ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවාට අදාළ ළමුන් සංඛ්‍යාව, පාලිකාවන් සංඛ්‍යාව සහ සහායිකාවන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2473/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට සහනාධාර ලබා දෙන ධීවරයින් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට ලබා දෙන සහනාධාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි එක්දින ධීවර යාත්‍රා, බහුදින යාත්‍රා, වෙනත් යාන්ත්‍රික නොවන යාත්‍රා සහ මාදැල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ධීවරයින් සඳහා ක්‍රියාත්මක වන රක්ෂණ ක්‍රමය කවරේද;

(ii) එම රක්ෂණ ක්‍රමයේ ස්වභාවය කුමක්ද;

(iii) ඒ සඳහා දායක වී ඇති ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම රක්ෂණ ක්‍රමය සඳහා රජය මගින් සිදුකරන දායකත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2612/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව අධ්‍යාපන විද්‍යාපීඨයේ ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා පසුගිය කාලයේදී වාර්ෂිකව සිසුන් 120 දෙනෙකු බඳවාගෙන ඇති බවත්;

(ii) ප්‍රතිපාදන කප්පාදුව හේතුවෙන් 2012 වර්ෂයේදී එම විද්‍යාපීඨයට බඳවාගෙන ඇත්තේ සිසුන් 60ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයිනේ සමස්ත පාසල් පද්ධතිය තුළ ශාරීරික අධ්‍යාපන ගුරුවරු සඳහා පුරප්පාඩු පවතින බවත්;

(ii) 2012 වර්ෂයේදී ඌව අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවාගත් ශාරීරික අධ්‍යාපන සිසුන්ගේ සංඛ්‍යාව අඩකින් අඩුකිරීම හේතුවෙන් ඉහත සඳහන් පුරප්පාඩු සපුරාලීමේ ඉලක්කය සපුරාගත නොහැකි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ඇති, ඌව පළාත ඇතුළුව දිවයින පුරා සිටින සිසුන්ට ඉහත තත්ත්වය නිසා මෙම වර්ෂයේදී සිදුවූ අසාධාරණය මඟහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1839/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රදේශයේ පිහිටා ඇති හෙල්වැල්ල පවුල් සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දිරාපත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටුකර දීමට හැකිවන පරිදි එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කරදීමට කඩිනමින් කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2129/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ එක් දිසාවකට ඇති මංතීරු ගණන කොපමණද;

(ii) එම එක් මංතීරුවක පළල කොපමණද;

(iii) අධිවේගී මාර්ගයක මංතීරුවක් සඳහා ජාත්‍යන්තරව පිළිගත් පළල කොපමණද;

(iv) සේවා සැපයීම සඳහා වෙන් කර ඇති මංතීරුවේ පළල කොපමණද;

(v) ඒ සඳහා ජාත්‍යන්තරව පිළිගත් පළල කොපමණද;

(vi) ඉහත මංතීරුවල පළල ජාත්‍යන්තර ප්‍රමිතියට වඩා අඩු වී තිබේද;

(vii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2183/'11

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ඉඩම් හිමිකම් අංශය විසින් දැනට පවතින හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති දුර්වලතා රාශියක් සොයාගෙන ඇති බවත්;

(ii) ඉහත කී පනත සංශෝධනය කළ යුතු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ද නිර්දේශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) සහ (ii) අනුව හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති දුර්වලතා සහ යෝජිත සංශෝධන කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) පාර්ලිමේන්තුව මගින් එම සංශෝධන සඳහා මේ වනවිට අනුගමනය කරමින් පවතින ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) දුර්වලතා රාශියක් පැවතියද, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත දැඩිව ක්‍රියාත්මක කරමින් සිටින බවත්;

(ii) අදාළ අමාත්‍යාංශය විසින්, එම හඳුනාගත් දුර්වලතා වෙනස් නොකර, ඉහත කී පනතට නව වගන්ති 105ක් ඇතුළු කිරීමට උත්සාහ දරමින් සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2347/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන් විසින් සපුරාලිය යුතු, රජය පිළිගත් සුදුසුකම් රාමුවක් තිබේද;

(ii) එසේ නම්, එම සුදුසුකම් හඳුන්වා දෙනු ලැබූ ආයතනය කවරේද;

(iii) වර්ෂ 2010 වනවිට අදාළ සුදුසුකම් සහිතව ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලැබූ පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) නියමිත සුදුසුකම් නොමැතිව වර්ෂ ගණනාවක් තිස්සේ ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන පාලිකාවන් සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ගයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ ) නොඑසේ නම්, ඒ මන්ද?

2474/’12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන,

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1840/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මුල්ගිරිගල ප්‍රදේශයේ වලස්මුල්ල නව වෙළඳ සංකීර්ණය විවෘත කර වර්ෂ එකහමාරක් ගතවී ඇතත්, මේ දක්වා ඉන් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ඇති බවත්;

(ii) නව වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකර ඇති බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම අරමුදල් සපයා ගනු ලැබුවේ දේශීයව ද; නැතහොත් විදේශීය මූලාශ්‍රවලින්ද ;

(iii) අරමුදල් සපයන ලද ආයතනය හෝ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වලස්මුල්ල නව වෙළඳ සංකීර්ණය නිසි ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) ජනතාවට ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි වෙළඳ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2130/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ සම්බන්ධීකාරකයන් ලෙස සේවය කළ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී සම්බන්ධීකාරකයින්ගේ නම් සහ ඔවුන් අනුයුක්තකර ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම තනතුර ලබා දී ඇති කාල සීමාව කවරේද;

(iv) ඔවුන්ගේ මාසික වැටුප සහ අනෙකුත් දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2184/'11

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්කිස්ස දිස්ත්‍රික් අධිකරණ සංකීර්ණයේ මහජනයාගේ ප්‍රයෝජනය පිණිස සවිකර ඇති විදුලි සෝපානය ක්‍රියාත්මක තත්ත්වයක පවතින්නේද;

(ii) නොඑසේ නම්, එය ක්‍රියා විරහිත වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලි සෝපානය සවිකිරීම සඳහා ඇස්තමේන්තු කළ වියදම කොපමණද;

(ii) විදුලි සෝපානය සවිකළ ඉංජිනේරුවන්ගේ නම් කවරේද;

(iii) විදුලි සෝපානය සවිකිරීම ඔවුන් නිසි පරිදි සිදුකර තිබේද;

(iv) මෙම විදුලි සෝපානය සම්බන්ධයෙන් වෙනත් ගැටලු පැනනැගී තිබේද;

(v) එසේ නම්, හඳුනාගෙන ඇති ප්‍රධානතම ගැටලුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම විදුලි සෝපානය සහ එය භාවිතාකිරීම පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ගල්කිස්ස නීතිඥ සංගමය විසින් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) එම ඉල්ලීම්වලින් පෙන්වාදී ඇති ගැටලු විසඳීම පිණිස දැනටමත් ගෙන ඇති සහ ඉදිරියට ගැනීමට නියමිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
## (2012 ඔක්තෝබර් මස 11 වැනි බ්‍රහස්පතින්දා)

2475/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2476/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමුපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2477/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලුතර දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනයවන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කලුතර දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමුපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2478/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනයවන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2479/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2480/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2481/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුලතිව් දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2482/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2483/’12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2484/’12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2485/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2486/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපළ සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපළ සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපළ සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමුපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1403/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2004 ජූනි මස 01 දින සහ 2011 ජූනි මස 01 දින වනවිට,

(i) ත්‍රිවිධ හමුදාවන්හි සිටි මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) ඒකාබද්ධ වැටුප සහ විශ්‍රාම වැටුප ලෙස ත්‍රිවිධ හමුදාවන්ට ගෙවනු ලබන මුළු මුදල කොපමණද;

(iii) ඔවුන්ට හිමිකම් ඇති අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 ජූනි මස 01 වැනි දින වනවිට හා 2011 ජූනි මස 01 දින වනවිට ත්‍රිවිධ හමුදාවලින් නොදන්වා සේවය හැරගිය සංඛ්‍යාව කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1881/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ගිරිබාව ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට නොගෙන විනාශවීමට ඉඩහැර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතනය කුමක්ද;

(iii) එම ගොඩනැගිල්ල මෙලෙස විනාශවීමට ඉඩහැර තිබීමට හේතු කවරේද;

(iv) ශ්‍රවණාගාරය භාවිතය සඳහා පවතින බාධාවන් ඉවත්කර මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(v) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතා අතුරුදන් වී ඇති දිනය කවරේද;

(ii) ඔහු මේ වන විට ජීවතුන් අතර සිටින්නේද;

(iii) වධහිංසාවලට එරෙහි ජාත්‍යන්තර කමිටුව හමුවේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පෙනී සිටි මොහාන් පීරිස් මහතා ප්‍රගීත් එක්නැලිගොඩ මහතා ජීවතුන් අතර සිටින බවට ප්‍රකාශ කර තිබේද;

(iv) එසේ ප්‍රකාශ කර තිබේ නම්, ඔහු සිටින රට හෝ ප්‍රදේශය පිළිබඳව සඳහන් කරන්නේද;

(v) ඔහු විදේශගතව සිටී නම්, මෙරටට ගෙන්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උක්ත කමිටුව හමුවේ දී මොහාන් පීරිස් මහතා කළ ප්‍රකාශය සාවද්‍ය නම්, රටේ උත්තරීතර ආයතනයක උත්තරීතර නිලයක් දැරූ අයෙකු එසේ සාවද්‍ය තොරතුරු ජාත්‍යන්තරයට නිකුත් කර රටට සිදු කළ බලවත් අපකීර්තිය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2210/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන අනුව, අඩු ආදායම් නාගරික ජනාවාස ව්‍යාපෘතිය යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන යටතේ මේ වන විට පර්චස් දෙකක පූර්ණ අයිතිය හිමිවූ පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2247/'12

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 අප්‍රේල් 01 වැනි දින ස්ථාපිත කරනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාවේ නිල කාල සීමාව;

(ii) එම කොමිෂන් සභාව සඳහා පත් කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් නිලධාරියාගේ සම්පූර්ණ නම හා අදාළ සුදුසුකම්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බදු අභියාචනා කොමිෂන් සභාව සඳහා කුලියට ගත් පස්මහල් ගොඩනැගිලි සංකීර්ණය පිහිටි ස්ථානය සහ ඒ සඳහා මාසිකව ගෙවන ලද කුලිය කවරේද;

(ii) එම කොමිෂන් සභාවේ සේවක වැටුප්, ජල සහ විදුලි බිල්පත් ඇතුළු පුනරාවර්තන වියදම් වෙනුවෙන් එහි පළමු මාස හය තුළ වැයවී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ පැවති බදු අභියාචනා ගොනු 120ක් අභිනව බදු අභියාචනා කොමිෂන් සභාව වෙත පැවරූ බවත්;

(ii) එම ගොනු සම්බන්ධ විභාග කිසිවක් අදාළ කාලසීමාව තුළ අවසන් කර නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් රජයට රුපියල් කෝටි 800ක පමණ මුදලක් අහිමිව ගිය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2291/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළාත් පාලන ආයතන මගින් පාලනය වන පෙරපාසල්වල පාලිකා තනතුරු වෙනස් කිරීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන ආයතන යටතේ ඇති පෙරපාසල්වල පාලනය වෙනත් ආයතනයන්ට මාරුකර තිබේද;

(ii) එසේ පාලනය මාරු කර ඇති පෙරපාසල් කවරේද;

(iii) එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක ඩීඑම්එස්/ඩී3/97/27/02 දරන ලිපිය මගින් අලුතින් පෙරපාසල් පාලිකා තනතුරු අනුමත නොකිරීමට ගෙන ඇති තීරණය පළාත් පාලන ආයතනවලින් පාලනය වන පෙරපාසල් වැසීයාමට හේතුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2300/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශය සමග විවිධ කටයුතුවල නිරත වී සිටින රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) පසුගිය වර්ෂ දහයක කාලය තුළ වතුකරයේ සහ උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් ප්‍රදේශවල විවිධ රාජ්‍ය නොවන ආයතන අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව විවිධ ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් යටතේ ඉටු කරන ලද කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) උක්ත වැඩසටහන් යටතේ පසුගිය වර්ෂ දහය තුළ ඒ ඒ ආයතනය වෙතින් අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබුණු මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2383/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඇණවුම් කරන ලද ඖෂධ ලැබෙනතෙක් ඖෂධ සැපයීම් ඌනතාවන් නැති කිරීම සඳහා දේශීය වෙළඳපළෙන් මිලදී ගත් ඖෂධ සඳහා ගෙවීමට රුපියල් මිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් 2011 වර්ෂය තුළ අනුමතියට ඉදිරිපත් වී තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව 2011 වර්ෂයේ ඖෂධ අවශ්‍යතාවයන් පිළිබඳව ඇස්තමේන්තුවක් නොතිබුණේද;

(ii) ඇණවුම් ප්‍රමාද වූ නිසා ඉහත වර්ෂය තුළදී දේශීය වෙළඳපළෙන් මිලදී ගැනීමට සිදු වූ ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ඇණවුම් කිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

(iv) දේශීය වෙළඳපළෙන් එම ඖෂධ මිලදී ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාමාර්ගය කුමක්ද;

(v) දේශීය වෙළඳපළෙන් මිලදී ගත් ඖෂධ වර්ග, ප්‍රමාණය හා මිලදී ගත් ආයතනය වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1882/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ගිංතොට, පියදිගම ප්‍රදේශයේ පවත්වාගෙන ගිය කොහු ආශ්‍රිත නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථානය මීට වර්ෂ කිහිපයකට පෙර සිට වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය වසා දැමීමට හේතු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය සතුව පැවති බලවේග යන්ත්‍ර සහ අත්ලණු යන්ත්‍රවලට සිදුවූයේ කුමක්ද;

(iii) ගිංතොට, පියදිගම කොහු ආශ්‍රිත නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(v) එසේ නම්, නිෂ්පාදන සහ පුහුණුවීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2140/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති අතළොස්සක් වූ පහතරට වැසි වනාන්තර අතරින් එකක් වූ ඉදිකඩ මූකලානට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම වනාන්තරය රක්ෂිතයක් ලෙස නම් කරන ලද දිනය කවරේද;

(iii) එයට අදාළ ගැසට් නිවේදනය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) එය රක්ෂිත වනාන්තරයක් ලෙස සැලකීම ඉවත් කර තිබේද;

(v) එසේ නම්, එය සිදුකළ දිනය කවරේද;

(vi) එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම රක්ෂිතයේ කොටසක කොළඹ නගරයෙන් ඉවත් කරන කැලි කසළ දැමීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) ඒ සඳහා ඉල්ලුම් කළ හෝ යෝජනා කළ අය කවුරුන්ද;

(iii) ඉතාමත් සීමිත වූ රක්ෂිත වනාන්තර අත්තනෝමතික ආකාරයට භාවිතා කිරීම අනාගත පරපුරට කරන අසාධාරණයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2193/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ දක්වා ගෙවා නොමැති ණය මුදල් ප්‍රමාණයෙහි එකතුව කවරේද;

(ii) එම ණය මුදල් ආපසු ගෙවිය යුතු කාල සීමාව කවරේද;

(iii) ණය මුදල් නැවත ගෙවීම මගින් එක් වර්ෂයකදී ඇතිවන බලපෑම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි සමස්ත වාර්ෂික ලාභය පසුගිය වර්ෂ පහක කාලය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වර්ෂය සඳහා සහ මීළඟ වර්ෂ දෙක සඳහා සමූහ ඒකාබද්ධ ගිණුම, ලාභ හෝ අලාභවලට අදාළව, වාර්ෂික පදනමින් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ පිහිටි වරායන්හි ප්‍රාග්ධන ව්‍යාපෘතීන්ට අදාළව සිදුකෙරෙමින් පවතින කාර්යයන් කවරේද;

(iv) එක් එක් ව්‍යාපෘතිය සඳහා දරන පිරිවැය කොපමණද;

(v) එම ව්‍යාපෘතීන් නිම කරනු ලබන දිනයන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2223/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කොළඹ නගරයේ පැල්පත්වාසීන්ගේ නිවාස ගැටලුව විසඳීම සඳහා නිවාස ඒකක 40,000කින් සමන්විත මහල් නිවාස යෝජනා ක්‍රම 20ක් කොළඹ සහ තදාසන්න නගරවල ඉදිකිරීම පිණිස රුපියල් කෝටි 500ක ආරම්භක ප්‍රාග්ධනයක් ඉදිරි අයවැයෙන් වෙන්කරන බවට පොරොන්දුවක් දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පොරොන්දුව පරිදි රුපියල් කෝටි 500 ක් අයවැයෙන් වෙන් කළ වර්ෂය කුමක්ද;

(ii) එම මුදලින් මේ වනවිට ඉදිකිරීම් ආරම්භකර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිකිරීම් අවසන් මහල් නිවාස යෝජනා ක්‍රමවල මේ වන විට පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2307/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පාසල් උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකක මගින් පාසල් පද්ධතිය තුළ ඉටුකරන කාර්යභාරය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විධිමත් ආකාරයේ උපදේශන සහ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් පවත්වාගෙන යනු ලබන රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සේවය කරන විධිමත් පුහුණුවක් ලැබූ උපදේශකවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2194/'11

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර කර්මාන්තයෙහි නියැලෙන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ධීවර ප්‍රජාව වෙනුවෙන් රජය මගින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් කවරේද;

(iii) එක් ධීවර පවුලක් සඳහා එක් වර්ෂයකට දරන වියදම කවරේද;

(iv) එක් ධීවර පවුලක් එක් වර්ෂයකදී ලබන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවර ක්ෂේත්‍රය සඳහා ණය ලෙස ලබාදෙන මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ධීවර ප්‍රජාව වෙත ලබා දෙන ලද ණය මුදල් කිසිවක් කපා හැර තිබේද;

(iii) එසේ නම්, එම පිරිවැය අමාත්‍යාංශය විසින් දරන ලද්දේද;

(iv) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් ලෙස දැරීමට සිදු වූ සමස්ත පිරිවැය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2224/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භකළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන්කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?